**<u>කුවේට් රජය විසින් ප්‍රකාශයට පත්කරන ලද පොදු සමා කාලය</u>**

**<u>2018.01.29 දින සිට 2018.02.22 දක්වා</u>**

කුවේට් රජය විසින් 2018 ජනවාරි මස 29 වන දින සිට 2018 පෙබරවාරි මස 22 වන දින දක්වා වීසා නීති උල්ලංඝණය කර ඇති පුද්ගලයන් සඳහා පොදු සමා කාලයක් අභ්‍යන්තර කටයුතු අමාත්‍ය තීරණ යටතේ ප්‍රකාශයට පත් කර ඇත.

මෙම පොදු සමා කාලය යටතේ නීත්‍යානුකූල වීසා නොමැතිව කුවේට්හි වෙසෙන විදේශිකයන්ට නියමිත කාලය තුල අදාළ දඩ මුදල් ගෙවීමකින් තොරව හා අදාළ කුවේට් ආයතන වල විශේෂ අවසර ලබාගැනීමකින් ද තොරව රටින් පිටවිය හැක. මෙසේ පිටවන අයට නීත්‍යානුකූල අයුරින් නැවත කුවේට් රාජ්‍යට පැමිණීමටද (වෙනත් නීතිමය බාධා නොමැති නම්) අවසර ලැබෙනු ඇත.

තවද මෙම සමා කාලය තුලදී තමන් විසින් ගෙවීමට ඇති අදාල සියලු දඩ මුදල් ගෙවා, වලංගු වීසා බලපත්‍රයක් ලබාගෙන තවදුරටත් කුවේට් රටේ රැඳී සිටීමටද අවසර ලබාදෙනු ඇත.

ගමන් තහනම් (Travel Ban) හෝ උසාවි මගින් තහංචි පනවා ඇති අයට මෙම පොදු සමාව අදාළ නොවන අතර එවැනි නීතිමය ගැටලු ඇති අය ළගම ඇති ජවසාත් (Department of Residency Affairs) වෙත ගොස් තම ගැටළු විසඳා ගැනීමට පියවර ගත යුතුය.

එසේම මෙම පොදු සමා කාලය තුළ කුවේට් රාජ්‍යයෙන් පිටවීමට අවසර ලබාදී තිබියදීත්, එසේ නොකර තවදුරටත් රැඳී සිටින පුද්ගලයින් අත්අඩංගුවට ගෙන රටින් පිටුවහල් කිරීමට නීති ප්‍රකාරව මෙරට බලධාරීන් විසින් පියවර ගනු ලැබේ. එමෙන්ම මෙම පොදු සමා කාලය පටන් ගන්නා 2018 ජනවාරි මස 29 දිනෙන් පසුව කුවේට් රටට පැමිණෙන සහ එදිනෙන් පසු නීති කඩකිරීම් සිදු කරන අය හට මෙම පොදු සමා කාලය හරහා සහනයන් නොලැබේ.

වර්තමානයේ කුවේට් රාජ්‍යයේ 15,447 ට ආසන්න ශ්‍රී ලාංකිකයන් පිරිසක් වලංගු වීසා නොමැතිව රැඳී සිටින අතර, මෙලෙස නීත්‍යානුකූල නොවන ලෙස ඔබගේ ඥාති මිත්‍රාදීන් ද කුවේට් රාජ්‍යයේ රැඳී සිටී නම් මෙම පොදු සමා කාලය තුළ තම වීසා යාවත්කාලින කරගැනීමට හෝ නැවත ශ්‍රී ලංකාවට යාමට කටයුතු කරන ලෙසට ඔවුන් දැනුවත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
කුවේට්

2018.01.24